දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )NA/04/TUTOR/TRA/2020
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )2020.12.

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

---

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල්/ මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා
සියලුම හෙද විදුහල්පතිවරුන් වෙත.

**1 ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2018**

1 ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ සිටින නිලධාරීන්ගේ ස්ථාන මාරු ලබා දීමට අදාලව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ අංක 01-31/2020 හා 2020.08.18 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද 1 ශ්‍රේණියේ හෙද නිලධාරීන් අතුරින් ස්ථාන මාරු අනුමත වී ඇති නිලධාරීන්ගේ සහ අනුමත නොවූ නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාමලේඛනය මේ සමඟ වේ.

03. 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ වැඩ භාරගත් දිනය අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව නිර්දේශ ලබා දී ඇත. එකම දිනයකදී වැඩභාරගත් නිලධාරීන්ගේ පශ්චාද් ප්‍රාථමික හෙද විදුහලේ දී ලබා ගත් කුසලතාවය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස්කරන ලද බව සැලකිය යුතුය.එසේම සියලුම වෘත්තීය සංගම්වල එකඟතාවය පරිදි හා වර්තමාන සේවා ස්ථානයට වාර්තා කරන ලද දිනය සළකා බලා ස්ථාන මාරු ලබා දී ඇත.

04. මෙම ස්ථාන මාරු ලේඛනය සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා සහ නිවැරදි කිරීම් පවතී නම් එම විරෝධතා / නිවැරදි කිරීම් සහ අභියාචනා පහත ලිපිනයට / ෆැක්ස් අංකයට 2021.01.14 දිනට පෙර දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.එන්.ආර්.කේ.රාජපක්ෂ
අධ්‍යක්ෂ (පාලන) 01
සෞඛ්‍ය අමාත්‍යාංශය
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

ෆැක්ස් අංක - 0112674967

05. අදාල විරෝධතා හා අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව අවසන් ලේඛනය සකස්කරන බැවින් මෙම ලේඛනය අවසාන ලේඛනය නොවන බව කාරුණිකව සලකන්න.

06. අවසන් ලේඛනය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.health.gov.lk) පල කරනු ලබන අතර, විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියෙකුට දැණුම් දෙනු නොලැබේ.

යූ.ඒ.එස්.එච්.සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය අමාත්‍යාංශය

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10